# සාමාන්‍ය සමයේ දස නව වන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය 1 රාජාවලිය 19: 9, 11–13

*රාජාවලියේ පළමුවන පොතෙන් උපුටා ගත් කොටසකි.*

"පිටතට අවුත් කන්ද මත සමිඳාණන් අබිමුවෙහි සිටින්න."

එලියා හොරෙබ් කන්දේ ගුහාවකට ඇතුළු වී නවාතැන් ගත්තේය. සමිඳාණන් වහන්සේගේ පණිවුඩය ද ඔහු වෙත පැමිණියේ ය. උන් වහන්සේ ඔහුට කතා කොට, "එලියා, නුඹ මෙහි කුමක් කරන්නෙහි දැ"යි ඔහුගෙන් ඇසූ සේක.

උන් වහන්සේ කතා කොට, "පිටතට අවුත් කන්ද උඩ සමිඳාණන් වහන්සේ ඉදිරියෙහි සිටින්නැ"යි වදාළ සේක. එවිට සමිඳාණන් වහන්සේ ඒ ළඟින් ගිය සේක. උන් වහන්සේට පෙරටුවෙන් මහා බලවත් හුළඟක් කඳු දෙදරවා, පර්වත බිඳ ගෙන ගියේ ය. එහෙත්, සමිඳාණන් වහන්සේ සුළඟෙහි නොවූසේක. සුළඟට පසු පොළෝ කම්පාවක් විය. එහෙත්, සමිඳාණන් වහන්සේ පොළෝ කම්පාවෙහි නොවූ සේක. පොළෝ කම්පාවට පසු ගින්නක් විය. එහෙත් සමිඳාණන් වහන්සේ ගින්නෙහි නොවූ සේක.

ගින්නට පසු මඳ පවනක හඬක් විය. එලියා ඒ අසා තමාගේ මුහුණ සළුවෙන් වසා ගෙන පිටතට ගොස් ගුහාවේ දොරකඩ සිටියේ ය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 85: 8–13

පිළිතුර : සමිඳුනි, ඔබේ තිර පෙම අපට පෙන්වුව මැනව.

ගීය : දෙවි සමිඳුන් වදාරන වදනට සවන් දෙමි,
මන්ද, සිය සෙනඟට ද සැදැහැවතුන්ට ද
එතුමාණන් තුළ විශ්වාසය තබන අයට ද
සමිඳාණෝ සාමදානය දීමට පොරොන්දු වූ සේක.

එතුමන් හට ගරුබිය පාන අයට
ගැලවීම ඉතා සමීප ව ඇත්තේ ය.
සත්තට ම එතුමන්ගේ මහිමාලංකාරය අප රටෙහි බබළන්නේ ය.
තිර පෙම සහ විශ්වාසවන්තකම හමු වන්නේ ය.
දැහැමි බව සහ සාමය වැළඳ ගන්නේ ය.

විශ්වාසවන්තකම මිහි තලයෙන් ඉහළට නගින්නේ ය.
දැහැමි බව සගලොවින් පහළට බසින්නේ ය.
සමිඳාණෝ අප සමෘද්ධිමත් කරන සේක.

අපේ දේශය එහි එලදාව නිපදවන්නේ ය.
දැහැමි බව එතුමන්ට පෙරටු ව යන්නේ ය.
එතුමන්ගේ පා සළකුනු මාර්ගයක් වන්නේ ය.

## දෙවන දේව ප්‍රකාශනය    රෝම 9: 1–5

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

“මාගේ සහෝදරයන් උදෙසා
ශාප ලද්දෙකු වීමට වුවද කැමැති වෙමි.”

“මම කිතුණුවෙකු වශයෙන් සත්‍යය පවසමි. මෙය මුසාවක් නොවේ. ඒ බවට ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ මාගේ හෘදය සාක්ෂිය සහතික කරයි. මා තුළ බලවත් ශෝකයක් ද හදවතෙහි නිරන්තර වේදනාවක් ද ඇත. මාගේ ලේ නෑයන් වූ සහෝදරයන් උදෙසා, ක්‍රිස්තුන් වහන්සේගෙන් වෙන් වී ශාප ලද්දෙකු වීමට හැකි නම් ඊට වුවත් මම කැමති වෙමි. ඔව්හු ඉශ්රායෙල්වරු ය, දේව පුත්‍රකමට පිළිගනු ලැබීම හා මහිමය ඔවුන්ගේ ය. ගිවිසුම් හා ව්‍යවස්ථාව ද දේව සේවය හා පොරොන්දු ද ඔවුන් සතු ය. ඔවුන් ජාතියේ පීතෘවරුන්ගේ පෙළපතට අයිති ය. මනුෂ්‍යයෙකු ලෙස ක්‍රිස්තුස් වහන්සේ උපන්නේත් එම පෙළපතෙහි ම ය. මුළු විශ්වයට අධිපති වූ දෙවියන් වහන්සේට සදහට ම ප්‍රශංසා වේ වා! ආමෙන්.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද ගීතාවලිය 130: 5

ආලේලූයා! ආලේලූයා!
මම සමිඳුන්ගේ උපකාරය උදක් ම බලා සිටිමි.
එතුමන්ගේ වචනය කෙරෙහි
බලාපොරොත්තුව තබමි.
ආලේලූයා!

## සුවිශේෂය මතෙව් 14: 22–33

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"වතුර මත ඔබ වෙත එන්න මට අණ කළ මැනව."

ජේසුස් වහන්සේ සමූහයා පිටත් කර හරින, අතර ඔරුවට නැඟී තමන්ට පළමුවෙන් එගොඩට යන ලෙස ශ්‍රාවකයන්ට නියම කළ සේක. උන් වහන්සේ ජනකාය යැවූ පසු, යාච්ඤා කරන පිණිස වෙන්ව කන්දට වැඩිය සේක. සවස් වූ කල්හි උන් වහන්සේ තනි ව එහි සිටි සේක. සුළඟ නදින් හැමූ බැවින් ඔරුව එවේලෙහි තරංගවල හැපෙමින්, ගැටෙමින් මුහුද මැද තිබිණි. අළුයම තුනටත්, හයටත්, අතර උන් වහන්සේ ඔවුන් වෙත මුහුද මතුපිට ඇවිදගෙන ආ සේක. ශ්‍රාවකයෝ උන් වහන්සේ මුහුද මත ඇවිදගෙන එනු දැක කලබල වී, "ඒ අවතාරයකැ"යි කියමින්, බියෙන් මොර ගැසූ හ. එහෙත්, ජේසුස් වහන්සේ එකෙණෙහි ම ඔවුන්ට කතා කොට, "ධෛර්යවත් වන්න, මේ මම ය; බිය නොවන්නැ"යි වදාළ සේක. පේදුරු උත්තර දෙමින්, "ස්වාමිනි, ඔය ඔබ වහන්සේ නම්, වතුර මත ඔබ වෙත එන්න මට අණ කළ මැනවැ"යි කී ය. "එන්නැ"යි උන් වහන්සේ වදාළ සේක. එවිට පේදුරු ඔරුවෙන් බැස, ජේසුස් වහන්සේ වෙත වතුර මත ඇවිදගෙන ගියේ ය. එහෙත් ඔහු මාරුතය වේගවත් බව දැක, බිය වී ගිලෙන්න පටන් ගෙන, "ස්වාමිනි, මා බේරාගත මැනවැ"යි මොර ගැසී ය. ජේසුස් වහන්සේ වහා ම අත දිගු කොට ඔහු අල්ලාගෙන, "ඔබේ ඇදහිල්ල කොතරම් හීන ද? සැක කළේ මන්දැ"යි විචාළ සේක. ඔවුන් දෙදෙන ඔරුවට නැගුණු කල සුළඟ නැවතිණි. එවිට ඔරුවේ උන් අය, "ඒකාන්තයෙන් ම ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය"යි කියමින් උන් වහන්සේට පසඟ පිහිටුවා වැඳ නමස්කාර කළහ.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*